**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව - 2015**

---------------------------------------------------------------------

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ 18 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතිය පරිදි සභාව ස්ථාපනය කර ඇති ගොඩනැගිල්ලේ ඉඩම්වල අයිතිය සභාව සතු නොවූ අතර ඒ පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ මෝටර් රථ වලට අදාල රු.5,116,750 ක ක්‍රමක්ෂය භාණ්ඩාගාර පර්යේෂණ ප්‍රදාන වලින් අඩුකළ යුතු වුවත් එය සභා අරමුදලට හර කර තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සේවක පාරිතෝෂික වෙන්කිරීම හා උපචිත ගමන් වියදම් පිළිවෙලින් රු. 656,761 ක් හා රු. 78,200 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2015 ජුනි 01 දින සිට HM 1-1 වැටුප් බණ්ඩය හිමි නිලධාරින්ට නිල වාහන හිමිකම් ලැබ් තිබුණද තම පෞද්ගලික වාහනය රාජකාරි කටයුතු වලට යාම් ඊම් සඳහා යොදා ගත් බව තහවුරු කර ගැනීමකින් තොරව 2015 මාස 03 ක් සඳහා නිල වාහන දීමනා හා ඉන්ධන දීමනා වශයෙන් රු. 516,550 ක මුදලක් ගෙවා තිබුණි.

### 2.2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම

ආරක්ෂක සේවා සැපයීම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂණයේදී 2015 පෙබරවාරි මාසයේ රු.89,196 ක් ගෙවීම් කර තිබුණද නිවැරදිතාව තහවුරු කිරීම සඳහා දෛනික සේවක පැමිණීම හා පිටවීම පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ යටතේ 2013 වර්ෂයේ සිට ඉදිරියට එන රු.2,629,517 ක ව්‍යාපෘති ගිණුමේ ශේෂය 2015 දෙසැම්බර් 31 දක්වාද නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයට අදාලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.18,796,555 වූ ජංගම නොවන වත්කම් සඳහා විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,594,269 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.1,640,735 ක ඌණතාවයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,235,004 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.4,242,810 කින් වැඩිවීම හා පරිපාලන වියදම රු.1,540,188 කින් අඩුවීම මෙම වර්ධනයට හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාම ආයතනයේ ශුද්ධ අලාභයක් ඇති වී තිබුණද 2015 වර්ෂයේදී රු.3,594,269 ක ශුද්ධ ලාභයක් විය. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.10,396,045 ක්වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂයේදී රු.34,888,202 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත අනුව ආර්ථික වශයෙන්, ඵලදායී, පරිසර හිතකාමී හා සාමාජයික වශයෙන් පිළිගැනෙන, ශක්තිමත් අන්තර්-ආයතනික සහයෝගිත්වය සහිත කෘෂිකාර්මික පර්යේෂණ හරහා කාර්මික අංශයේ ඵලදායීතාව, ලාභදායී බව හා තිරසාරත්වය සහතික කිරීම සහ ජාතික ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සභාවේ ප්‍රධාන කාර්යයන් වුවද එම කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිසි වේලාවට ලබා නොගැනීම නිසා එම කාර්යයන් ප්‍රමාණාත්මක ලෙස ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2014 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් රු.20,447,000 ක් ලැබී තිබූ නමුත් 2015 වර්ෂය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන 2014 වර්ෂයේ සැප්තැම්බර් මාසයට පෙර ඉල්ලීම් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් රු.978,655 ක් පමණක් ලැබී තිබුණි.

(ඇ) යථෝක්ත හේතුව නිසා ක්‍රියාකාරි සැලැස්ම අනුව ජාතික කෘෂිකර්ම පර්යේෂණ, ජාතික කෘෂිකර්ම ප්‍රමුඛතා සකස් කිරීම හා ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩ සටහන් ඇගයීමට අදාල වූ ව්‍යාපෘති සම්බන්ධයෙන් රැස්වීම් 86 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද රැස්වීම් 62 ක් පැවැත්වීමට නොහැකි වී තිබුණි. එසේම ජාතික කෘෂිකර්ම පර්යේෂණ 60 ක ස්ථානීය ව්‍යාපෘතිය ඇගයීමට හා පර්යේෂණ ආයතන 06 ක් පිළිබඳ බාහිර සමාලෝචනය කිරීමට සැලසුම් කර තිබුණද පිළිවෙලින් පර්යේෂණ 51 ක් නොපැවැත්වීම හා පර්යේෂණ ආයතන 05 ක් සමාලෝචනය කිරීම සිදුවී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාව තම අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂමව හා වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීමට පරිගණක දෘඩාංග හා මෘදුකාංග (වැඩසටහන්) ස්ථාපිත කිරීම වෙනුවෙන් ඉකුත් වර්ෂවලදී රු.2,404,427 ක මුලික වියදමක් දරා තිබුණද මෙම පද්ධති, සභාවේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා උපයෝගි කර ගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) තනතුරු 09 ක් සඳහා බඳවා ගැනීමට 2014 නොවැම්බර් 23 හා 26 දිනයන්හි ඉංග්‍රිසි පුවත්පත් දෙකක දැන්වීම් පළකර තිබුණද, විගණිත දිනය වූ 2016 මැයි 12 වන විටත් මේ සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීම් කටයුතු සිදු කර නොතිබුණි.

## 4.3 ආර්ථික නොවූ ගණුදෙනු

සභාවේ අවශ්‍යතාවය අනුව අන්තර්ජාල පහසුකම් අවශ්‍යවන නිලධාරින් සඳහා අවම පිරිවැයකින් භාවිතාකළ හැකි අන්තර්ජාල සම්බන්ධතාවයක් තෝරා නොගෙන පසුගිය වර්ෂයේ රු.1,836,027 ක් වැයකර මාසිකව බදු මුදල රු.56,120 ක්වූ ටෙලිකොම් ලීස්ලයින් සම්බන්ධතාවයක් මිලදී ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයෙදී ඒ වෙනුවෙන් රු.673,440 ක මුදලක් වැය කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2002 මැයි 24 දිනැති අංක PF/PE/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම වර්ෂය ආරම්භ වන විට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත් සභාව විසින් ක්‍රියාකාරී සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2015 නොවැම්බර් 06 දින දීය.

## 5.3 අභ්‍යන්තර විගණනය

ආයතනය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත පැවරී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණද අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ මූලධන වැය සඳහා වූ අයවැයගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 99 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පරිපාලනය | භාණ්ඩාගාරයෙන් ලබාදෙන පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන ඉල්ලුම් කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| (ආ) තොග පාලනය | i. තොග ලැබීම් සටහන් කිරීමේ ලැබීම් පත්‍රිකා අංක සටහන් නොකිරීම. |
| | ii. නිසි අධිකාරි බලයකින් තොරව තොග නිකුත් කිරීම. |
| | iii. පාරිභෝගික ද්‍රව්‍ය නිකුත් කිරීම් තොග ලේඛණවල සටහන් කර තිබීම. |